# 07 ශ්‍රේණිය දෙවන වාරය
# සිව්වැනි පාඩම

**නිපුණතා මට්ටම 2.4 : ක්ෂණික නිරූපණය**

- ක්ෂණික නිරූපයක් යනු පෙර සූදානමකින් තොරව සිදුකරන්නාවූ රංගනයකි.
- මේ සඳහා පිටපතක් භාවිතා කිරීමක් සිදු නොවේ.
- ක්ෂණික නිරූපණයක දී පුහුණුවකින් තොරව චරිතයක්, සිද්ධියක් හෝ අවස්ථාවක් රඟදක්වයි.
- ක්ෂණික නිරූපන සිදුකිරීම මගින් නළුවා ක්ෂණික ව අවබෝධ කරගැනීමේ ශක්තිය ලබාගනී.
- සතුන් මිනිසුන් ද්‍රව්‍ය උපයෝගී කරගෙන ද ක්ෂණික නිරූපණ සිදු කරයි.
- ක්ෂණික නිරූපනයේ දී අවස්ථාවට උචිත පරිදි කටයුතු කළ යුතුයි.
- ක්ෂණික ව තීරණ ගැනීම කළ යුතුය. ක්ෂණිකව සංවාද සකසා ගත යුතුය.
- කතාවක් ගොඩ නගා ගත යුතු අතර ඇතැම් විට රංගනය සිදුකරන විටදීම කතාව සහ සංවාද සකස් කිරීම සිදුකළ හැකිය.
- නාට්‍යෝචිත අවස්ථා ක්ෂණිකව ගොඩනැගීම මගින් ඇතිවන්නාවූ අනපේක්ෂිත ප්‍රේක්ෂක ප්‍රතිචාරයන්ට මුහුණ දීමට රංගනය සිදුකරන අවස්ථාවේදීම සිදුවේ. එවිට ක්ෂණිකව ක්‍රියාමාර්ගයන් ගත යුතු වේ.
- ක්ෂණික නිරූපණ සිදු කිරීම මගින් නිර්මාණශීලී චින්තනය පරිකල්පන ශක්තිය වැනි ගුණාංග වර්ධනය වේ.



**අභ්‍යාස**

පහත දැක්වෙන චරිත කිහිපයක් ක්ෂණිකව රඟදක්වන්න. (මෙම චරිත සිදුකිරීමේ දී පෙර සූදානමකින් තොරව සිදුකරන්න.)

1. කෑදර ළමයෙක්
2. සැර පරුෂ පියෙක්
3. අහිංසක මවක්
4. මසුරු ආච්චි කෙනෙක්

5. මෝඩ මිනිසෙක්

6. නපුරු කුඩම්මා කෙනෙක්

7. මසුරු වෙළෙන්දෙක්

8. කපටි හිඟන්නෙක්

9. සැර පරුෂ හෙදියක්

10.මුදල් නැතිවූ මගියෙක්

11.පරාජිත ක්‍රීඩකයෙක්

මෙම රංගනයේ දී පරිකල්පන ශක්තිය මෙහෙයවීම ඉතාමත් වැදගත් වේ. පරිකල්පන ශක්තිය මෙහෙයවා නිර්මාණාත්මක ව ඉදිරිපත් කළ යුතු වේ.